ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2014/12/31 |

## 2014 වසර අවසානයේ දී උද්ධමනය පහළ තනි ඉලක්කමක මට්ටමට ළඟා වේ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2013 දෙසැම්බර් මස වාර්තා කළ සියයට 4.7 ට සාපේක්ෂව 2014 දෙසැම්බර් මාසයේ දී සියයට 2.1 දක්වා පහළ වැටිණි. අඛණ්ඩව මාස 19 ක් පුරා අඩු වන ප්‍රවණතාවයක් පෙන්නුම් කළ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2013 දෙසැම්බර් මස පැවති සියයට 6.9 හි සිට 2014 දෙසැම්බර් මාසයේ දී සියයට 3.3 දක්වා පහළ වැටිණි. විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වාදීමෙන් පසු මේ වන තෙක් වාර්ෂික සාමාන්‍ය පදනම මත (මාස 71) සහ ලක්ෂ්‍යමය පදනම මත (මාස 65) උද්ධමනය අඛණ්ඩව තනි ඉලක්කමක මට්ටමෙහි පැවති දීර්ඝතම කාලපරිච්ඡේදය මෙය වේ.

විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තිය; සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවති විනිමය අනුපාතිකය; ආහාර මෙන්ම ආහාර නොවන ආනයනික අයිතමයන්ගේ මිල ගණන් පහළ යාම; සැපයුම් අංශයෙහි දැකිය හැකි වූ යහපත් ප්‍රවණතා; විදුලිය හා ජල ගාස්තු, එල්.පී. ගෑස් හා ඉන්ධන මිල ගණන් ආදී පරිපාලිත මිල ගණන් පහළ දැමීම සහ

සැපයුම් අංශයෙන් මතු වූ බාධාවන් පාලනය කිරීම සඳහා නිසි කලට මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් සමග සුසංයෝගීව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දීම 2014 වර්ෂය තුළ උද්ධමනය පහළ අගයක පවත්වා ගැනීමට ඉවහල් විය.




ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් ඉහළ යාම අඩු වේගයකින් සිදුවීම 2014 දී වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 3.3 දක්වා පහළ යාමට ප්‍රධාන දායකත්වය සැපයීය. 2013 වසරේ දී සියයට 6.1 ක් වූ ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් ඉහළ යාම 2014 වසරේ දී සියයට 2.8කට සීමා විය. 2014 වසරේ අග මාසවල දී විදුලිය හා ජල ගාස්තු සහ ඉන්ධන මිල ගණන් පහළ දැමීම ද මේ සඳහා උපකාරී විය. එහි ප්‍රතිඵලයක් ලෙස, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයේ සාමාන්‍ය මිල ගණන් 2014 වසරේ දී සියයට 1.1 කින් පමණක් ඉහළ ගියේය. මීට අමතරව, රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩයේ අයිතමයන්ගේ මිල ගණන් 2013 වසරට වඩා අඩු වේගයකින් ඉහළ යාම උද්ධමනයේ මෙම පහළ යාම සඳහා හිතකර ලෙස බලපෑවේය. කෙසේ වුවද, ආහාර හා මධ්‍යසාර නොවන පාන අයත් උප කාණ්ඩයේ මිල ගණන් 2013 වසර සමග සැසඳීමේ දී සාපේක්ෂව ඉහළ අගයකින් එනම්, සියයට 3.8 කින් වැඩිවීම උද්ධමනය මත පීඩනයක් ඇති කළේය.




ආර්ථිකයේ දිගුකාලීන යටිදැරි උද්ධමනය පෙන්නුම් කරන මූලික උද්ධමනය වාර්ෂික සාමාන්‍ය පදනම මත 2013 දෙසැම්බර් මස වාර්තා කළ සියයට 4.4 හි සිට 2014 දෙසැම්බර් මාසයේ දී සියයට 3.5 දක්වා පහළ වැටිණි. වසර තුළ සුළු වශයෙන් ඉහළ පහළ ගිය ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය 2013 දෙසැම්බර් මස පැවති සියයට 2.1 හි සිට 2014 දෙසැම්බර් මස දී සියයට 3.2 දක්වා ඉහළ ගියේය.